පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - පෙරදිග සංගීතය

සතිය-3 සතිය

ශ්‍රේණිය - 07

Prepared by- සංගීත ආචාර්ය සමාධි විනෝදා ගමකුඹුර මිය
ර/බළ/ශ්‍රී බද්ධ ජයන්ති ම.ම.වි.

## කෝලම් ගීත ගායනය

කෝලම් නාටකයන්හි ගීත ගායනය බොහෝ විට අදාළ චරිත විසින් ම සිදු කරනු ලබන අතර සබේ විදානේ ගයන ගීත ද, ඒ අතර වේ. ජස ලෙංචිනා කෝලම, මුදලි කෝලම, අණබෙර කෝලම, සැඳකිඳුරු කෝලම ආදිය ඉන් කිහිපයක් පමණි.

සබේ විදානේ විසින් ජසයාගේ පැමිණීම අරභයා ගැයන ගීතයක්:-

පෙර සිට පැවත එන - සිරිතට පොදිය බැඳගෙන
උරපිට තබාගෙන - යෝධ ජසයා ඒ ය දුවගෙන

ජසයා සබයට පැමිණීමෙන් පසු ගයන ගීතයක්:-

ගම්භිර කාලිංග නුවර නිරිඳුගේ වාසල තුළයට
ඉන්න දනා පේම රජුට සෝදා පට පිළී සොඳට
ඉන් නරනා තැබූ නම මට ජේඩි විදානේ සත්තට
මං මෙතනට ආමි වියන් බඳිනට නරනිඳු එන විට

ජසයා සබයට පැමිණීමෙන් පසු ගයන තවත් ගීතයක්:-

ගම්වල හැම තැන ඇවිද ගොසින්නේ - වෙල්ලාවට රෙදි තෝරා ගන්නේ
සොඳ සොඳ පිරුවට වියන් බඳින්නේ - ජේඩි හමා වද සබේ නටන්නේ

ලෙංචිනා සබයට පැමිණීමෙන් පසු ගයන ගීතයක්:-

මං වගේ ජේඩි කතක් මනා - දුටුවා ද ලොවේ රුසිරෙන් දිනා
මං කළ පෙර පවකින් ගෙනා - මට හිමි වුණේ මහලු වූ වෙසමුණා

මවුපියෝ නිදහස් වෙන්නටා - මාව දුන්නයි නාකි වූ හමෙකුටා
උන්දලා හට කඹුරන්නටා - යැද ඉන්න සුරන් හට දෙස් කොටා

කෝලම් ගැමි නාට්‍යවල ලක්ෂණ

1. වෙස්මුහුණු පැළඳ රඟ දැක්වීම
2. පහත රට ප්‍රදේශයේ ප්‍රචලිත නාට්‍ය විශේෂයකි (මිරිස්ස, අම්බලන්ගොඩ)

3. “තානායම්පල “ නම් ස්ථානයේ රඟ දක්වයි.
4. සෑම චරිතයක්ම රඟ දක්වන්නේ පුරුෂයන් විසිනි.
5. පහත රට ශාන්ති කර්මවල ආභාසය ලැබී ඇත.
6. පහත රට බෙරය,(යක් බෙරය) වාදනය සඳහා යොදා ගනී.
7. සමාජයේ පවතින දුර්වල තැන් උපහාසයට ලක් කර පණිවිඩයක් ලබා දේ.

කෝලම් නාට්‍ය පාඩම ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. කෝලම් නාට්‍යයේ රඟ දක්වන චරිත 05 ක් ලියන්න.
2. කෝලම් නාට්‍යවල සුවිශේෂී ලක්ෂණ 03 ක් ලියා දක්වන්න.